*පණස් වසරක විවාහ උදානය*

*කුසුම් + විජේ*

*ආදර අන්දරයට උපහාර*

සදාදරණීය පුංචි අක්කාගෙන්

මින්දද දෙහදට හී සර යැව්වා
මන් පිනවන නෙක නෙත්සර පෑවා
කෙම් බිම සරසවි පෙම්බිම වූවා
රන් රස සේ සතුටින් එක් වූවා

හන්තානයෙ කඳු පියස හමා යන
අතින’ත පටලා මදනළ විඳගෙන
මහවැලි ගංතෙර සිසිලස ලබමින
දිවි ගෙවුවානේ පෙම් සුව විඳිමින

කිරි-පැණි ලෙස ඇරඹූ යුග දීගය
නන් රසයෙන් මන මත් වූ දීගය
නන් දොඩමින් රස මුසු කළ දීගය
මන් පිනමින් අද ගෙවනා දීගය

සව් සිරියෙන් සතුටින් ඉතිරේවා!
නිදුක්-නිරෝගී සුවසෙත වේවා!
තෙරුවන් සරණේ පිහිට ලැබේවා!
සැම දෙවිඳුන් රැකවරණය වේවා!

අඩ සියවසක් ඔබ දෙදෙනා ගෙව්වාට
නෝබෙල් සම්මානයක් වටිනව දෙන්ට
හදපිරි සතුට පතනෙමි ඔබ දෙදෙනාට
උපහාරයක් වේවා! සොහායුරු පෙමට

කළ්‍යාණි සෙනරත් යාපා 24-11-2021